Department of
Social Statistics,
University of
Kelaniya
DOSS_2012/2013
SS/2012/0670

# වෘත්තිකයින් අතර ජංගම දුරකථන බැංකු ක්‍රමයේ භාවිතය හා ප්‍රවනතා

**අයි. පී. එච්. සමුද්‍රිකා**

**සංක්ෂේපය**

ජංගම දුරකථන බැංකු සේවාව යනුවෙන් හඳුන්වන්නේ ගිණුම්හිමියන්ට කෙටි පණිවිඩ ලබා ගත හැකි අනර්ග පහසුකමක් වන අතර මෙම සේවය මඟින් ජංගම දුරකථනය ඔස්සේ ඔවුන්ට විවිධාකාර බැංකු පහසුකම් ලබා ගැනීමේ හැකියාව ලැබෙනු ඇත. කොතැනක සිටියද පහසුවෙන් ගනුදෙනු කිරීමට පහසු ක්‍රමයකි. වඩා ආරක්ෂිත පහසු ක්‍රමයක් මෙන්ම කාර්යක්ෂමතාවයකින් යුක්ත වීම, පාරිභෝගික වංචාව අඩු කිරීම ආදී විශාල වාසි රැසක් ජංගම දුරකථන බැංකු සේවාව මඟින් ලබා දෙන අතර ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ වෘත්තිකයන් අතර බැංකු කටයුතු සඳහා ජංගම දුරකථන බැංකු සේවාවන් කෙරෙහි ඇති නැඹුරුතාවය සොයා බැලීමයි. ඊට අමතරව වෘත්තිකයන් ජංගම දුරකථන බැංකු සේවාව හඳුනා ගැනීමට සහ හඳුනා නොගැනීමට හේතු මොනවාද යන්න සොයා බැලීමත් මෙහිදී සිදුකර ඇත. ඒ අනුව පර්යේෂණය සඳහා තෝරා ගනු ලැබුයේ ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වේයන්ගොඩ නගර ප්‍රදේශයේ මාලිගාතැන්න ග්‍රාම නිලධාරී කොට්ඨාශය වෙයි. එය අධ්‍යයනයේ සංගහනය ලෙස යොදා ගනිමින් ක්‍රමවත් නියැදුම් ක්‍රමය ඇසුරින් නියැදිය ලෙස 100 ක පිරිසක් තෝරා ගන්නා ලදී. තෝරා ගන්නා ලද නියැදි ඒකක සඳහා ප්‍රශ්නාවලි ලබා දීම මගින් ප්‍රාථමික දත්ත රැස්කර, රැස්කරන ලද දත්තයන් SPSS මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව වෘත්තිකයන් අතර ජංගම දුරකථන බැංකු සේවාව භාවිතය හා ප්‍රවනතාවයක් දැක්වීමට ප්‍රධාන හේතු ලෙස ආදායම, වයස, පෙළඹවීම, වෘත්තිය යන සාධක ප්‍රධාන සාධක ලෙස අනාවරණය විය.

**මුඛ්‍ය පදඃ *ජංගම දුරකථන, බැංකු සේවා***

hasinisamudrika9897@gmail.com